## *2020/21 මහ කන්නයේ වගා රැස්වීමේ තීරණ* මුරුතවෙල ව්‍යාපාරය .

- ✓ වැවේ ජල තත්ත්වය - අක්කර අඩි 18715
- ✓ වගා කිරීමට යෝජිත ප්‍රදේශ - යාය 02 ඩී 08/09 හා යාය 03
- ✓ වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - අක්කර 2125
- ✓ වගා කිරීමට අපේක්ෂිත භෝග - වී මාස 03,මාස 3 ½ හා අතිරේක බෝග
- ✓ ගොවි සංවිධාන හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ඇළ හා බෙදුම් ඇළ, කෙත් ඇළවල් නඩත්තු කර අවසන් කළ යුතු දිනය - 2020/10/31
- ✓ ගොවීන් විසින් ඇළවල් වල නඩත්තු කටයුතු අවසන් කළ යුතු අවසන් දිනය -2020/10/25
- ✓ ගොවීන් විසින් නියමිත වේලාවට නඩත්තු නොකරන ලද ඇළවල් ගොවි සංවිධානය විසින් නඩත්තු කර අවසන් කළ යුතු දිනය - 2020/10/31
- ❖ ඇළවෙලි ශුද්ධ නොකරන ගොවීන් සදහා දඩය - කෙත් ඇළ/බෙදුම් ඇළ බඹයකට රු 250.00
- ❖ ඇළ කණ්ඩිවලට වල් නාශක ඉසීමේ දඩය - රු 500.00
- ❖ ගවයින් අයාලයේ යැවීමේ දඩය - එක් ගවයකුට රු 1000.00
- ❖ නියර නොබැදීමේ දඩය - අක්කරයකට රු 500.00
- ❖ ගොවි සංවිධාන නඩත්තු අරමුදල (සංවර්ධන අරමුදල)-වගා කන්නයකට අක්කර1 සදහා රු 75.00

- මුලවරට ජලය නිකුත්කිරීමට යෝජිත දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2020/11/01
- බිම් සැකසීම ආරම්භ කළයුතු දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2020/11/01
- ට්‍රැක්ටර් හා ගවයින් යායෙන් ඉවත් කළයුතු දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2020/11/15
- වී වපුරා හෝ පැළ සිටුවා අවසන් කළයුතු දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2020/11/15
- වගා රක්ෂණය කර අවසන් කළයුතු දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2020/11/15
- මුර ජලය ආරම්භකරන දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2020/11/16
- අවසන්වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2021/02/20
- වගා හානි දැනුම් දියයුතු අවසන් දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2021/03/10
- අස්වනු නෙලා අවසන් කළයුතු දිනය -
  යාය 02 ඩී 08/09 හා යාය 03 :- 2020/03/10

ඉහත පරිදි දින වකවානු යෝජනා කලද ඉදිරි වර්ෂා රටාවද සැළකිල්ලට ගෙන මෙම දින සංශෝදනය කිරීම ව්‍යාපාර කමිටුවට පවරන ලදී.
ඉහත වගා රැස්වීමේ තීරණ පහත සදහන් නිළධාරින් විසින් යෝජනා කර ස්ථිර කරන ලදි.

යෝජනා කලේ
ඩබ්.එම්.ආරියදාස
යාය 03 ඩී 02 ගොවි සංවිධායේ සභාපති

ස්ථිර කලේ
සරත් ජයවර්ධන
යාය 03 ඩී 06 ගොවි සංවිධානයේ සභාපති

### *යාය 03 ඩී 09 ගොවි සංවිධානයේ සභාපති -ජී.ජී.ප්‍රේමතිලක මහතා*

ප්‍රධාන ඇලේ ඩී 01 සිට පහළට ඇළ මහ කැලේකින් වැසී ඇති බවත් ජලය නිකුත් කිරීමට පෙර එය ශුද්ධ කර දෙන ලෙස වාරිමාර්ග ඉංජිනේරු වරයාගෙන් ඉල්ලා සිටියේය.

### *ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු -වීරකැටිය එස්.එම්.එස්. වර්ණසිංහ මහතා*

කම්කරුවන්ට වැටුප් ගෙවීමටවත් මුදල් නොමැති බවත් ඇළ ශුද්ධ කිරීමට ප්‍රතිපාදන නොමැති බව පැවසීය.

***යාය 02 ඩී 06 ගොවි සංවිධායේ සභාපති එම්.ඒ.කුමාරසිරි මහතා***

2020 යල කන්නය අවසන් වූ දින සිටම මුරුතවෙල වැවේ සිට ඇලේ ජලය නිකරුනේ ගලා බවත් මෙ පිළිබදව විමසු විට මුරුකවෙල ජලාශයේ දොර කැඩී ඇති බව පැවසුවත් මෙම දොර සාදන තෙක් වැවට එන ජලය ඇළවල් දිගේ ගලා යන බැවින් වැවේ ජල ධාරිතාව වැඩි නොවන බවත් එය කඩිනමින් සාදන ලෙසත් ඉල්ලා සිටියේය.තවද යාය 02 කොටසේ ඇළවෙලි ශුද්ධ කළ යුතු අවසාන දිනය කෙදිනකදැයි විමසීය.

***නේවාසික ව්‍යාපෘති කළමනාකරු -කේ.ජයසිංහ මහතා***

දින 12 කට වරක් අතිරේක බෝග වගාවන් සදහා ජලය නිකුත් කරන බැවින් නිරන්තරයෙන් ඇළ පද්ධතිය නඩත්තු කළ යුතු බැවින් ඇළවල් ශුද්ධ කිරීමට ගොවීන් දැනුවත් කරන ලෙස ගොවි නියෝජිතයන්ගෙන් ඉල්ලීමක් කරන ලදී.

***යාය 03 ඩී 02 ගොවි සංවිධානයේ සභාපති -ඩබ්.එම්.ආරියදාස මහතා***

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් සකස් කළ පස් අවුරුදු සැළැස්මේ යාය 03 ඩී 02 ගොවි සංවිධායේ ප්‍රමුඛතාවයට එෆ් සී 43 ඇතුලත් කරත් එම ඇළේ ඕ.ජ්. ධර්මසේන යන අය මෙයට විරුද්ධ බැවින් එම කොටසේ මැනුම් කටයුතු කර රක්ෂිතය වෙන් කර දෙන මෙන් ඉල්ලා සිටියේය.මෙම ඇළ අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වීරගස්වැව ග්‍රාම නිළධාරි වසමට අයත් වන බවද පැවසීය.

නේවාසික ව්‍යාපෘති කළමකාකරුගේ ස්තූති කතාවෙන් පසු රැස්වීමේ කටයුතු අවසන් විය.

K. [signature]

කුමුදු සී.ලොකුහේවාගම
ප්‍රාදේශීය ලේකම්
වීරකැටිය